# ප්‍රසම්පාදන නිවේදනයයි.
# අමු/පිසු ආහාර සැපයිම - 2027
# ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන පහත සඳහන් රෝහල් වලට **2027.01.01** සිට **2027.12.31** දින දක්වා කාල සීමාවට පිසු ආහාර සැපයිම සඳහා ජාතික තරඟකාරී ක්‍රමය යටතේ ලංසු කැඳවනු ලැබේ.

| පැකේජ් අංකය | රෝහල | ලංසු ආකෘති පත්‍ර ගාස්තු මුදලින් (රු:) | ලංසු සුරක්ෂණය (රු:) | වත්කම් සහතිකයේ වටිනාකම(රු:) |
|---|---|---|---|---|
| **A ශ්‍රේණියේ මූලික රෝහල්** | | | | |
| 01 | මූලික රෝහල දියතලාව | 6,000.00 | 384,660.00 | 700,000.00 |
| **B ශ්‍රේණියේ මූලික රෝහල්** | | | | |
| 02 | මූලික රෝහල බිබිල | 4,000.00 | 258,110.00 | 600,000.00 |
| 03 | මූලික රෝහල වැලිමඩ | 6,000.00 | 451,680.00 | 700,000.00 |
| 04 | මූලික රෝහල වැල්ලවාය | 4,000.00 | 153,780.00 | 600,000.00 |
| 05 | මූලික රෝහල සියඹලාණ්ඩුව | 2,000.00 | 115,560.00 | 600,000.00 |
| 06 | මූලික රෝහල බණ්ඩාරවෙල | 2,000.00 | 145,390.00 | 600,000.00 |
| **A ශ්‍රේණියේ ප්‍රාදේශීය රෝහල්** | | | | |
| 07 | ප්‍රාදේශීය රෝහල පස්සර | 2,500.00 | 112,920.00 | 600,000.00 |
| 08 | ප්‍රාදේශීය රෝහල බුත්තල | 2,500.00 | 104,570.00 | 600,000.00 |
| **B ශ්‍රේණියේ ප්‍රාදේශීය රෝහල්** | | | | |
| 09 | ප්‍රාදේශීය රෝහල හපුතලේ | 2,000.00 | 53,400.00 | 500,000.00 |
| 10 | ප්‍රාදේශීය රෝහල ඌවපරණගම | 2,500.00 | 55,400.00 | 500,000.00 |
| 11 | ප්‍රාදේශීය රෝහල කන්දකැටිය | 2,500.00 | 54,210.00 | 500,000.00 |
| 12 | ප්‍රාදේශීය රෝහල ලුණුගල | 2,500.00 | 67,625.00 | 500,000.00 |
| 13 | ප්‍රාදේශීය රෝහල ගිරාඳුරුකෝට්ටේ | 2,500.00 | 75,100.00 | 500,000.00 |
| 14 | ප්‍රාදේශීය රෝහල ඌරණිය | 1,500.00 | 36,280.00 | 300,000.00 |
| 15 | ප්‍රාදේශීය රෝහල මීගහකිවුල | 1,500.00 | 53,935.00 | 500,000.00 |
| 16 | ප්‍රාදේශීය රෝහල කොස්ලන්ද | 1,500.00 | 47,200.00 | 400,000.00 |
| 17 | ප්‍රාදේශීය රෝහල මැටිගහතැන්න | 1,500.00 | 34,670.00 | 300,000.00 |
| 18 | ප්‍රාදේශීය රෝහල මැදගම | 1,500.00 | 42,450.00 | 400,000.00 |
| 19 | ප්‍රාදේශීය රෝහල තණමල්විල | 1,500.00 | 87,640.00 | 600,000.00 |
| 20 | ප්‍රාදේශීය රෝහල බඩල්කුඹුර | 1,500.00 | 48,150.00 | 400,000.00 |
| 21 | ප්‍රාදේශීය රෝහල ඉඟිණියාගල | 1,500.00 | 27,310.00 | 200,000.00 |
| 22 | ප්‍රාදේශීය රෝහල කතරගම | 1,500.00 | 50,810.00 | 500,000.00 |
| 23 | ප්‍රාදේශීය රෝහල හල්දුම්මුල්ල | 1,500.00 | 52,780.00 | 600,000.00 |
| 24 | ප්‍රාදේශීය රෝහල කන්දේගෙදර | 1,500.00 | 37,570.00 | 300,000.00 |
| 25 | ප්‍රාදේශීය රෝහල හොප්ටන් | 1,500.00 | 31,100.00 | 300,000.00 |
| 26 | ප්‍රාදේශීය රෝහල සෙවනගල | 1,500.00 | 59,380.00 | 500,000.00 |
| 27 | ප්‍රාදේශීය රෝහල බොරලන්ද | 1,500.00 | 46,360.00 | 400,000.00 |
| 28 | ප්‍රාදේශීය රෝහල ඇටැම්පිටිය | 1,500.00 | 35,550.00 | 300,000.00 |
| 29 | ප්‍රාදේශීය රෝහල දෙමෝදර | 1,500.00 | 47,750.00 | 400,000.00 |
| 30 | ප්‍රාදේශීය රෝහල බෝගහකුඹුර | 1,500.00 | 35,720.00 | 300,000.00 |

| | | | | |
|---|---|---|---|---|
| **31** | ප්‍රාදේශිය රෝහල කැන්දගොල්ල | **2,500.00** | **46,510.00** | **400,000.00** |
| **32** | ප්‍රාදේශිය රෝහල මිරහවත්ත | **1,500.00** | **31,590.00** | **300,000.00** |
| **33** | ප්‍රාදේශිය රෝහල මිදූම්පිටිය | **2,500.00** | **39,570.00** | **300,000.00** |
| **34** | ප්‍රාදේශිය රෝහල හම්බේගමුව | **1,500.00** | **33,070.00** | **300,000.00** |
| **35** | ප්‍රාදේශිය රෝහල ඔක්කම්පිටිය | **1,500.00** | **63,290.00** | **500,000.00** |
| **36** | ප්‍රාදේශිය රෝහල රෝබේරිය | **1,500.00** | **23,650.00** | **200,000.00** |
| **37** | ප්‍රාදේශිය රෝහල ග්ලැනෝර් | **1,500.00** | **17,810.00** | **200,000.00** |
| **38** | ප්‍රාදේශිය රෝහල නැදුන්ගමුව | **1,500.00** | **27,210.00** | **200,000.00** |
| **39** | ප්‍රාදේශිය රෝහල ගලඋඩ | **1,500.00** | **32,000.00** | **300,000.00** |
| **40** | ප්‍රාදේශිය රෝහල ඇකිරියන්කුඹුර | **1,500.00** | **22,830.00** | **200,000.00** |
| **41** | ප්‍රාදේශිය රෝහල දඹාන | **1,500.00** | **22,740.00** | **200,000.00** |
| **42** | ප්‍රාදේශිය රෝහල කහටරුප්ප | **1,500.00** | **26,700.00** | **200,000.00** |
| **43** | ප්‍රාදේශිය රෝහල දඹගල්ල | **1,500.00** | **38,420.00** | **300,000.00** |
| **44** | ප්‍රාදේශිය රෝහල හිඟුරුකඩුව | **1,500.00** | **18,300.00** | **200.000.00** |
| **45** | ප්‍රාදේශිය රෝහල ඇතිමලේ | **1,500.00** | **27,240.00** | **200,000.00** |
| **46** | ප්‍රාදේශිය රෝහල පිටකුඹුර | **1,500.00** | **16,750.00** | **200,000.00** |
| **47** | ප්‍රාදේශිය රෝහල හඳපානාගල | **1,500.00** | **24,480.00** | **200,000.00** |
| **48** | වැවේගම ප්‍රාදේශීය රෝහල | **1,500.00** | **25,460.00** | **200,000.00** |
| **49** | බල්ලකැටුව ප්‍රාදේශීය රෝහල | **1,500.00** | **25,460.00** | **200,000.00** |

(I) අසාධු ලේඛනගත නොවූ ශ්‍රී ලාංකික පුරවැසියෙකු, රජයේ ලියාපදිංචි සමිතියක් හෝ සමාගමකට මේ සඳහා ඉදිරිපත් විය හැකිය. එමෙන්ම රජයේ ලියා පදිංචි සමාගමක් නම් එය ශ්‍රී ලංකාවේම ක්‍රියා කිරීම සඳහා බලය ඇති ආයතනයක් විය යුතු අතර, පසුගිය වසරේ විගණනය කළ අවසන් ගිණුම් වාර්තාව හෝ බැංකු ගිණුමේ පසුගිය තෙමසේ බැංකු ප්‍රකාශය ඉදිරිපත් කල හැකි විය යුතුය.

(II) **2026.09.01** දිනට පසු ප්‍රාදේශිය ලේකම් විසින් නිකුත් කරන ලද **"පොදු 170"** ආකෘතියේ වත්කම් සහතිකයේ වටිනාකම තිරුවේ සඳහන් වටිනාකමට වත්කම් සහතික හා ස්ථිර පදිංචිය පිළිබඳ සහතියක් අදාල ප්‍රාදේශිය ලේකම්ගෙන් ලබා ගෙන ඉදිරිපත් කළ යුතුය.

(III) ඉහත වගුවේ සඳහන් ලංසු සුරක්ෂණ ගාස්තුව ඌව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂගේ නමින් ඇති බදුල්ල මහජන බැංකුවේ ගිණුම් අංක **269-100188440649** දරණ ජංගම ගිණුමට තැන්පත් කර එම තැන්පතු ලදුපත ඌව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ මුදල් සහකාර වෙත ඉදිරිපත් කර ඒ සඳහා කුවිතාන්සි පතක් ලබා ගෙන එහි මුල් පිටපත ලංසු ආකෘති පත්‍ර සමඟ ඉදිරිපත් කල යුතුය. නැතහොත් නියමිත වටිනාකමට අදාළව ඌව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ නමින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත පිළිගත් වාණිජ බැංකුවකින් ලබාගත් කොන්දේසි විරහිත, ඉල්ලූවිට ගෙවනු ලබන, **2027.03.03** දින දක්වා වලංගු ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කළ හැකිය.

(IV) ආකෘති පත්‍ර ලබා ගැනීම සඳහා ඉහත වගුවේ සඳහන් ලංසු ආකෘති පත්‍ර ගාස්තුව ඌව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ මුදල් සහකාර වෙත මුදල් ගෙවා කුවිතාන්සියක් ලබා ගෙන, එම කුවිතාන්සිය ඉදිරිපත් කර සතියේ වැඩකරන දිනවල පෙ.ව **9.00** සිට ප.ව. **3.00** දක්වා ලංසු ආකෘති පත්‍ර මෙම කාර්යාලයෙන් ලබා ගත හැකිය.

(V) **C** ශ්‍රේණියේ හෝ **B** ශ්‍රේණියේ ප්‍රාදේශිය රෝහලක වසරක කාලයක් සඳහා පිසූ ආහාර සාර්ථකව ලබාදී පලපුරුද්දක් ඇත්නම් **A**ශ්‍රේණියේ ප්‍රාදේශිය රෝහල් සඳහා ද, **A** හෝ **B** ශ්‍රේණියේ ප්‍රාදේශිය රෝහලක වසර දෙකක කාලයක් සඳහා ආහාර සාර්ථකව ලබාදී පලපුරුද්දක් ඇත්නම් **B** ශ්‍රේණියේ මූලික රෝහල් සඳහාද, **B** ශ්‍රේණියේ මූලික රෝහලක වසර දෙකක කාලයක් සඳහා පිසූ ආහාර සාර්ථකව ලබාදී පලපුරුද්දක් ඇත්නම් **A** ශ්‍රේණියේ මූලික රෝහලක් සඳහාද ඉල්ලුම් කිරීමට හැකියාව ඇත. **C** හා **B** ශ්‍රේණියේ ප්‍රාදේශිය රෝහල් සඳහා පලපුරුද්දක් අවශ්‍ය නොවේ.

(VI) එක් එක් රෝහල් සඳහා ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන ලංසු ආකෘති පත්‍ර යුගලය එනම් මුල් පිටපත හා අනු පිටපත වෙන වෙනම කවරවල බහා මුද්‍රා තබා එම කවර දෙක එක් කවරයක බහා කවරයේ වම් පස ඉහල කෙලවරේ (රෝහලේ නම) "…………..රෝහලේ ආහාර සැපයිමේ ලංසු **2027"** යනුවෙන් සඳහන් කර ඊට පහලින් අයදුම්කරුගේ නම හා ලිපිනය සඳහන් කළ යුතුවේ.

(VII) ඌව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය මඟින් **2026.10.14** දින සිට **2026.11.02** වන දින දක්වා පෙ.ව. **9.00** සිට ප.ව.**3.00** දක්වා ලංසු ආකෘති පත්‍ර නිකුත්කරනු ලබන අතර, **2026.11.03** දින පෙ.ව. **10.00** දක්වා ලංසු ආකෘතිපත් භාර ගනු ලැබේ. එදිනම පෙ.ව. **10.30** ට ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ රැස්වීම් ශාලාවේදි ලංසුපත් විවෘත කරනු ලබයි. ඒ අනුව, අදාල ලංසු නියමිත වේලාවට පෙර ඌව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරි නිල කාමරයේ තබා ඇති ලංසු පෙට්ටියට බහාලිය යුතුවේ. නැතහොත් එකී වේලාවට පෙර ලැබෙන සේ සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන මණ්ඩලය, ඌව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය , අංක **301**, ආර්.එච්.ගුණවර්ධන මාවත, බදුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, නියමිත දින නියමිත වේලාවෙන් පසු ලැබෙන ලංසු පත්‍ර, විවෘත කිරීමකින් තොරවම ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(VIII) ලංසු ආකෘතිපත් විවෘත කරන අවස්ථාවට ලංසු පත් ඉදිරිපත් කළ ලංසුකරුට හෝ ඔහුගේ බලය ලත් නියෝජිතයකු සහභාගි කරවිය හැකි අතර, ඔහු විසින් තම අනන්‍යතාවය තහවුරු කිරීමට සමත් විය යුතුය.

(IX) රුපියල් මිලියන **05** වැඩි වටිනාකම් සහිත ලංසු සඳහා සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව මඟින් ලබා ගන්නා ලද පොදු කොන්ත්‍රාත් ගිවිසුමේ පිටපතක් අමුණා ඉදිරිපත් කල යුතුය. ඒ අනුව (දියතලාව, වැලිමඩ, බිබිල, සියඹලාණ්ඩුව, වැල්ලවාය, බණ්ඩාරවෙල මූලික රෝහල් හා පස්සර, බුත්තල, හපුතලේ, ලුණුගල, ඌව පරණගම, කන්දකැටිය, ගිරාදුරුකෝට්ටෙ, මීගහකිවුල, තණමල්විල, කතරගම, හල්දුම්මුල්ල, සෙවනගල, ඔක්කම්පිටිය යන ප්‍රාදේශිය රෝහල් සඳහා පොදු කොන්ත්‍රාත් ගිවිසුම ඉදිරිපත් කල යුතුය.)

(X) රෝගීන්ට ආහාර සැපයිම ඉතා වගකිව යුතු කාර්යයක් වන හෙයින් ලංසු කොන්දේසි උල්ලංඝණය කරන අයදුම්කරුවන්ගේ ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඕනෑම ලංසුවක් ප්‍රතික්ෂේප කිරිම හෝ පිළිගැනිමේ අයිතිය ප්‍රසම්පාදන මණ්ඩලය සතුවේ. තෝරා ගත් ලංසුකරුට ඒ බව දැනුම්දී සති **02**ක් ඇතුලත දි නියම කරනු ලබන ගිවිසුම් ඇප මුදල, මුදලින් තැන්පත් කර බැංකු ඇපකරයක් ඉදිරිපත් කර ගිවිසුමට එළැඹිය යුතු අතර, ආහාර සැපයිම **2027.01.01** දින සිට ආරම්භ කළ යුතුවේ.

(XI) පිසු ආහාර සැපයිමට අදාලව පූර්ව ලංසු සාකච්ඡාවක් **2026.10.26** වන දින පෙ.ව. **10.00** ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ රැස්වීම් ශාලාවේදී පැවැත්වෙන බැවින්, ඒ සඳහා උනන්දුවක් දක්වන අයට සහභාගි විය හැකිය.

(XII) මෙම දෙපාර්තමේන්තුවේ www.healthdept.up.gov.lk වෙබ් ලිපිනයට පිවිසීමෙන් විස්තරාත්මක තොරතුරු ලබා ගත හැකිය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන මණ්ඩලය,
ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව,
අංක 301, ආර්.එච්.ගුණවර්ධන මාවත,
බදුල්ල.
දුරකථන අංකය (- 055 – 2231981) ෆැක්ස් අංකය (-055 – 2223098)